# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1983 අංක 22 දරන
# අසභ්‍ය ප්‍රකාශන (සංශෝධන)
# පනත

---

[සහතිකය සටහන් කළේ 1983 ජූලි මස 05 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1983 ජූලි මස 08 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැකිය

මිළ : ශත 35 යි    තැපැල් ගාස්තුව : ශත 50 යි

# 1983 අංක 22 දරන අසභ්‍ය ප්‍රකාශන (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1983 ජූලි මස 05 වන දින.]

එල්. ඩී.—ඕ. 110/78

**අසභ්‍ය ප්‍රකාශන ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

1. මේ පනත 1983 අංක 22 දරන අසභ්‍ය ප්‍රකාශන (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

2. අසභ්‍ය ප්‍රකාශන ආඥාපනතේ 2 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් වගන්තිය ආදේශ කරනු ලැබේ:— 30 වන අධිකාරයේ 2 වන වගන්තිය සංශෝධනය කිරීම.

"අසභ්‍ය ප්‍රකාශන සම්බන්ධ වැරදි.

2. පහත සඳහන් ක්‍රියාවන්, එනම්:—

(අ) වෙළෙඳාම පිණිස හෝ වෙළෙඳාමක් වශයෙන් හෝ බෙදා හැරීම සඳහා හෝ මහජන ප්‍රදර්ශනය සඳහා හෝ දක්වා ඇති හෝ දක්වා නොමැති කාර්ය සඳහා හෝ අසභ්‍ය ලියවිලි, චිත්‍ර, මුද්‍රිත ඡායාරූප, සිතුවම්, මුද්‍රිත ද්‍රව්‍ය, පින්තූර, විශාල දැන්වීම්, ලාංඡන, ඡායාරූප, සිනමා පටි, රූපවාහිනී කැසට් පට හෝ වෙන යම් අසභ්‍ය දේ සෑදීම, නිෂ්පාදනය කිරීම හෝ තමා සන්තකයේ තබා ගැනීම;

(ආ) ඉහත කී කාර්ය සඳහා එකී අසභ්‍ය ද්‍රව්‍ය හෝ දේ අතුරෙන් කිසිවක් ආනයනය කිරීම, ගෙනයෑම හෝ අපනයනය කිරීම හෝ ඒවා ආනයනය කිරීමට, ගෙනයෑමට හෝ අපනයනය කිරීමට සැලැස්වීම හෝ කවර ලෙසකින් හෝ ඒවා සංසරණයට පත් කිරීම;

(ඇ) එකී අසභ්‍ය ද්‍රව්‍ය හෝ දේ අතුරින් කිසිවක් හා සම්බන්ධ පොදුවූ හෝ පෞද්ගලික වූ හෝ ව්‍යාපාරයක් කර ගෙන යාම හෝ ඊට සහභාගි වීම නැතහොත් කවර ලෙසකින් හෝ එකී ද්‍රව්‍ය හෝ දේ පිළිබඳව කටයුතු කිරීම, හෝ ඒවා බෙදා හැරීම හෝ ප්‍රසිද්ධියේ ප්‍රදර්ශනය කිරීම හෝ ඒවා අතමාරුවට දීමේ ව්‍යාපාරයක් කිරීම;

(ඈ) එකී දඬුවම් කළ හැකි සංසරණය හෝ වෙළෙඳාම සඳහා ආධාර කිරීමේ අදහස ඇතිව දඬුවම් කළ හැකි ඉහත කී ක්‍රියාවන් ගෙන් යම් ක්‍රියාවක හෝ යම් තැනැත්තකු යෙදී සිටින බව කවර ලෙසකින් හෝ ප්‍රචාරය කිරීම හෝ දැනුම් දීම, හෝ ඉහත කී අසභ්‍ය ද්‍රව්‍ය හෝ දේ කෙළින්ම හෝ

අන් ලෙසකින් ලබා ගත හැක්කේ කෙසේ ද නැතහොත් කවරකුගෙන් ද යන වග ප්‍රචාරය කිරීම හෝ දැනුම් දීම ;

යන ක්‍රියාවන් අතුරින් යම් ක්‍රියාවක් සම්බන්ධ යෙන් මහේස්ත්‍රාත්වරයකු විසින් වරදකරු කරනු ලැබූ විට, ඒ ක්‍රියාව—

(1) පළමු වරදට රුපියල් දෙදහසකට නොවැඩි දඩයකින් හෝ මාස හයකට නොවැඩි කාලයකට දෙයාකාරයෙන් එක් ආකාර යක බන්ධනාගාරගත කරනු ලැබීමෙන්, හෝ එකී දඩය හා බන්ධනාගාරගත කරනු ලැබීම යන දඬුවම් දෙකින් ම ; තව ද

(2) පළමු වරදට වරදකරු කරනු ලැබීමෙන් පසු කරන ලද තදනන්තර වරදක් සඳහා මාස හයකට නොවැඩි කාලයකට දෙයා කාරයෙන් එක් ආකාරයක බන්ධනාගාර ගත කරනු ලැබීමෙන් සහ ඊට අතිරේකව, රුපියල් දෙදහසක් නොඉක්මවන දඩ යකින් ;

දඬුවම් කළ යුතු, මෙම ආඥාපනතට විරුද්ධ, වරදක් විය යුතු ය.".